**සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය - 2023**

**---------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ "මණ්ඩලය" සහ එහි පරිපාලිතයෙහි "සමූහය" 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

[

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2024 අප්‍රේල් 01 දින වනවිට ද 1981 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාලව සේවායෝජක ආයතන 4,526 ක් විසින් මණ්ඩලය වෙත බැර කරන ලද එකතුව රු.මිලියන 516.79 ක දායක මුදල් 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල පනතේ 16 (3) වගන්තිය ප්‍රකාරව ඒ ඒ සාමාජිකයන්ගේ පෞද්ගලික ගිණුම්වලට බැර කර නොතිබුණි. මේ හේතුවෙන් සාමාජික අරමුදල් ශේෂය හා කේවල ගිණුම් ශේෂ එකතුව අතර නොසැසඳීමක් අනාවරණය විය. ඉහත ශේෂය තුල ඇතුලත් වසර 09 ත් 42 ත් අතර කාලයක සිට පැවත එන රු.මිලියන 20 ක ශේෂයක් ද විය. | 1981-2014 දක්වා කාලපරිච්ඡේදයට අදාලව විභජනය නොකල දායක මුදල් ශේෂය රු.මිලියන 13.773 ක් වූ අතර එම මුදලින් රු.මිලියන 10ට වඩා වැඩි මුදල් ප්‍රමාණයක් එක් සේවායෝජක ආයතනයකට අදාලව විභජනය කළයුතු මුදල් වේ. තවද 2015-2022 දක්වා තවදුරටත් විභජනය කළයුතු මුදල් ශේෂය රු.මිලියන 503.02 කි. සේවායෝජක විසින් මුදල් බැර විය යුතු සාමාජිකයන්ගේ විස්තර අප වෙත ඉදිරිපත් කළපසු අදාල සාමාජිකයන්ගේ ගිණුම්වලට විභජනය කිරීම වර්තමාන ක්‍රමවේදය වේ. | දායක මුදල බැරවිය යුතු සාමාජිකයින් නිවැරදිව හදුනා ගැනීම, සාමාජික මුදල් අයකිරීමේ නව ක්‍රම වේදය වැඩි දියුණු කිරීම හා හදුනා නොගත් මුදල් කඩිනමින් හදුනාගැනීමට වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම කළ යුතුය. |
| (ආ) | 1982 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාලව සේවායෝජකයින් හඳුනාගත නොහැකිව 2023 දෙසැම්බර් 31 දිනට V 999 අවිනිශ්චිත ගිණුමෙහි පවතින රු.මිලියන 6.52 ක ශේෂ වටිනාකම නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මණ්ඩලයේ දැනුවත් වීමකින් තොරව සේවායෝජකයා විසින් සිදුකර තිබු බැරකම් වලට අදාලව අංක V 999 හා V 100 දරන අවිනිශ්චිත ගිණුම් දෙකෙහි රු.මිලියන 6.52 ක් වූ ශේෂයක් 2023 දෙසැම්බර් 31 දිනට පවති. එම මුදලින් 1982 සිට 2006 දක්වා කාලය තුල සේවායෝජකයින් විසින් සිදුකර ඇති ගෙවිම්වල ශේෂය වෙනස් කිරීමට නොහැකි වන පරිදි පරිගණක පද්ධතිය තුල (AS 400) අගුලු දමා තිබේ. නිවැරදි සේවායෝජකයින් හඳුනාගැනීමෙන් පසු මෙමෙ මුදල් නිවැරදි සේවායෝජක | ශේෂ හදුනාගෙන සාමාජික ගිණුම්වලට බැර කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ගිණුම්වල ගිණුම්ගත කරනු ලබන බව. | |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට සමාගම් දෙකක කරන ලද ආයෝජන සඳහා වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් පවතින ලැබිය යුතු පොළී ආදායම වූ රු.මිලියන 24.967ක් හා ඒ සඳහා ප්‍රතිපාදන ගැලපීම පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත 37 ප්‍රකාරව හෙළිදරව් කිරීමක් මූල්‍ය ප්‍රකාශන මගින් දක්වා නොතිබුණි. | ආයෝජනය සඳහා ලැබිය යුතු පොළී ආදායම වූ රු.මිලියන 24.97ක් වෙනුවෙන් ප්‍රතිපාදන වෙන්කිරීම නිවැරදිව ගලපා තිබේ.<br>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 37 ප්‍රකාරව ගිණුම්කරණ සටහනක් මගින් දැක්වීමට ඉදිරියේදී කටයුතු කරනු ලබන බව. | ගිණුම්කරණ සටහන් මගින් අනාවරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | මණ්ඩලය විසින් 1994 වර්ෂයේ දී සියයට 14.48 ක ස්ථාවර පොළී අනුපාතයක් යටතේ වැවිලි සමාගමක කරන ලද රු.මිලියන 15 ක ණයකර ආයෝජනය වෙනුවෙන් 2023 දෙසැම්බර් 31 දින වන විට අයවිය යුතු හිඟ පොළී මුදල රු.මිලියන 26.3 ක් වුවත් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු ශේෂය රු.මිලියන 9.39 ක් ලෙස දක්වා තිබුණි. | 2011, 2019 සහ 2020 වර්ෂවලදි සමාගම සමග එකග වූ පසු නැවත ගෙවීමේ සැලසුමකට (Repayment Plan) අනුව පිය වූ මුදල් ප්‍රමාණය අඩු වූ පසු ඉතිරි පොළී ලෙස රු.මිලියන 9.39 ක් ගිණුම්වල 2023.12.31 දින වනවිට අයවිය යුතු ලෙස පෙන්වා තිබේ. ආයෝජිත ප්‍රාග්ධනයෙන් අවසන් වාරිකය පියවූ 2010 වසර දක්වා අයවිය යුතු ඉතිරි ශේෂය රු.මිලියන 26.3 ක් බව ආයෝජන කොටඨාශ ගණනය අනුව වාර්තා වේ.<br>මෙතෙක් ගිණුම්ගත කර ඇති මුදල ඉක්මවා කිසියම් මුදල් ප්‍රමාණයක් ලැබෙන්නේ නම් එයද නියමිත පරිදි ගිණුම්ගත කිරීමට පියවර ගනු ලැබේ. | ලැබිය යුතු ශේෂය නිවැරදිව ගලපා ගිණුම් වලින් අනාවරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2022 මාර්තු 15 දිනැති ලිපිය මගින් මුදල් අමාත්‍යාංශය විසින් මණ්ඩලය වෙත ප්‍රදානය කරන ලද පිරිවැය රු.මිලියන 6.8 ක මෝටර් රථය මණ්ඩලයේ කාර්යයන් සඳහා භාවිතා කර තිබුණද වත්කම තක්සේරු කර ගිණුම්ගත කිරීම 2023 අගෝස්තු මාසයේ දි සිදුකර තිබුණි. ඒ අනුව වත්කම් භාවිතා කල මාස 17 ක කාලයක් සඳහා ක්ෂය ගැලපිම් සිදුකර නොතිබුණි. | මුදල් අමාත්‍යාංශය විසින් මණ්ඩලය වෙත ප්‍රදානය කරන ලද මෝටර් රථයේ පිරිවැය රු.මිලියන 6.8කි. පවරන ලද දිනට මෝටර් රථයේ වටිනාකම ගිණුම්වලට ඇතුලත් කිරීම සඳහා තක්සේරු වටිනාකමක් නොමැති වූ අතර, එම වාහනය රක්ෂණය කිරීමේදී ලබා ගන්නා ලද තක්සේරු වටිනාකම පදනම් කරගෙන 2023 අගෝස්තු මාසයේදී මෙම වත්කම ගිණුම්ගත කරන ලදි. වාහනයේ තක්සේරු වටිනාකමක් නොමැති වූ බැවින් ගිණුම්වලට ගැනීමට පෙර භාවිතා කල කාලය වෙනුවෙන් මෙම වත්කම වෙනුවෙන් ක්ෂය ගැලපීම් සිදුකල නොහැකි විය. | පිරිවැය/හෝ තක්සේරු වටිනාකම මත නිවැරදිව ක්ෂය ගණනය කර ගිණුම්වල සටහන් කළ යුතුය. |

**1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|

| | | | |
|---|---|---|---|
| (අ) | මණ්ඩලයට අයත් නවම් මාවතෙහි පිහිටි ඉඩමක පවත්වාගෙන යනු ලබන රථගාලෙහි වාහන නැවතුම් පහසුකම් ලබාගන්නා ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම්වලට එළඹීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණු අතරම එම ගනුදෙනුකරුවන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති රු.මිලියන 8.096 ක මුදලින් 2024 ජුලි 09 දිනවන විට තවදුරටත් අයවිය යුතු මුදල රු.මිලියන 3.73 ක් විය. මේ තුල 2017 සිට 2022 වර්ෂ වලට අදාලව අයවිය යුතු මුදල රු.මිලියන 1.04 කි. 2016 වර්ෂයත් 2023 වර්ෂයත් අතර කාල පරාසයට අදාලව රු. 912,514 ක හිඟහිටි මුදල් පවතින ගනුදෙනුකරුවන් 15 ක් මගින් ආරක්ෂණ තැන්පතු මුදල් අයකරගැනීමට ද කටයුතු කර නොතිබුණු අතර ගනුදෙනුකරුවන් 38 කගෙන් රු.මිලියන 2.4 ක ලැබිය යුතු කුලී මුදල් පැවතුණු අතර එය ලබාගත් ආරක්ෂිත තැන්පතු මුදල ද ඉක්මවා තිබුණි. | ඉදිරියේදී ගනුදෙනුකරුවන් සමග වලංගු ගිවිසුමක් සකසා ප්‍රායෝගික භාවිතයට ගැනීමට අපේක්ෂා කෙරේ. 2023 දෙසැම්බර් 31 දිනට 2015 සිට අයවිය යුතු මුදල රු.මිලියන 3.73 ක් වන අතර මේ තුල 2017 සිට 2023 වර්ෂයට අදාලව අයවිය යුතු මුදල රු.මිලියන 1.01 කි. 2017 ජනවාරි 01 දිනට ප්‍රථම රථගාල තුල ලියාපදිංචි වී ඇති ගණුදෙනුකරුවන් වෙත අදාල තැන්පතු මුදල් තැන්පත් කරන ලෙස ලිඛිතව හා වාචිකව දැනුවත් කල මුත් ඒ සඳහා යහපත් ප්‍රතිචාර මෙතෙක් ලැබී නොමැත. අලුතින් වාහන ගාල් කිරීම සඳහා ඉල්ලුම් කරන අවස්ථාවේදී ආරක්ෂක තැන්පතු මුදල් අදාල වාහන ප්‍රමාණය අනුව තැන්පත් කිරීම අනිවාර්ය කර ඇත. | ලැබිය යුතු මුදල් අයකර ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කල යුතුය. |
| (ආ) | 2023 දෙසැම්බර් 31 දින වන විට මණ්ඩලය විසින් 1994 වර්ෂයේ දී සියයට 14.48 ක ස්ථාවර පොළී අනුපාතයක් යටතේ වැවිලි සමාගමක කරන ලද රු.මිලියන 15 ක ණයකර ආයෝජනය වෙනුවෙන් අයවිය යුතු හිඟ පොලී මුදල රු.මිලියන 26.29 ක් විය. මේ සම්බන්ධයෙන් 2023 මාර්තු 27 දින අදාල ආයතන හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මැදිහත් වීම මත කරන ලද සාකච්ඡා අනුව හිඟ මුදල ගෙවීමට පියවර ගන්නා ලෙස නියම කර තිබුණද 2024 වර්ෂයේ ජුනි මස විගණන අවස්ථාව වන විටත් මෙම මුදල් මණ්ඩලය වෙත අයවී නොතිබුණි. | 2023 මාර්තු 27 දින සමාගම සමග පැවති සාකච්ඡාවකදී සමාගමේ වර්තමාන මූල්‍ය තත්වය අනුව මෙම පොළී මුදල් පියවීම සඳහා යම්කිසි කාලයක් ගතවිය හැකි බවත් මේ පිළිබඳව අදාල රේඛීය අමාත්‍යාංශය සමග සාකච්ඡා කර සැළැස්මක් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව පැවසුවද මෙතෙක් ඉදිරිපත් කොට නොමැති අතර ඉදිරියේදී නැවතත් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මැදිහත් කර ගනිමින් එම මුදල් අයකර ගැනීමට ඇති හැකියාව පිළිබඳව සොයා බලා සුදුසු පියවරක් ගනු ලබන බව. | පසු විපරම් කටයුතු සිදු කර අයවිය යුතු පොළී ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2002 වර්ෂයේ කල්පිරීමට යටත්ව සමාගමක පොරොන්දු නෝට්ටුවල ආයෝජනය කර තිබූ රු.මිලියන 12.17 ක් සඳහා හා 2007 වර්ෂයේ දී කල්පිරීමට යටත්ව ණයකරවල ආයෝජනය කර තිබූ රු.මිලියන 7.45 ක් සඳහා අයවිය යුතු පොළී මුදල් පිළිවෙලින් රු.මිලියන 15.21 ක් හා රු.මිලියන 0.37 ක් විය. මෙම ආයතනය ඇවර කිරීම සඳහා 2008 ඔක්තෝබර් 03 දින දිසා අධිකරණයේ නියෝග ලබාදී තිබුණ ද 2024 මැයි 04 දින වනවිටත් මෙම මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් නිශ්චිත තහවුරුවක් මණ්ඩලයට නොතිබුණි. මේ නිසා | මෙම සමාගම ඇවරකිරීම සඳහා 2008 වසරේදී අධිකරණය විසින් නියෝගයක් ලබාදී තිබූ මුත් මේ දක්වා ඇවරකරුවකු පත්කොට නොමැත. පසුකාලීනව මෙම සමාගමේ ණයගැති පාර්ශවයක් විසින් අධිකරණ නියෝගයක් මත රු.මිලියන 42.6ක මුදලක් ඇවරකිරීමේ නඩුවේ බැරට තැන්පත් කර තිබේ. එම මුදලින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට කිසියම් හිමිකමක් ඇති නම් එම මුදල අයකර ගැනීමට ඇති හැකියාව පිළිබඳව 2024 මාර්තු 12 දිනදී නීතිපති උපදෙස් පතා ලිපියක් යොමුකර ඇත. | පසු විපරම් කටයුතු සිදු කර අයවිය යුතු පොළී ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

සාමාජිකයන් වෙත ගෙවිය යුතු ප්‍රතිලාභ අඩුවී තිබුණි.

### 1.6.2 ගෙවිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට හිමිකම් නොපාන ලද සාමාන්‍ය ප්‍රතිලාභ ගිණුම්වල පවතින වසර 20 කට වැඩි ශේෂවල එකතුව රු.මිලියන 3.83 ක් වූ අතර අදාල සාමාජිකයින් හඳුනාගෙන මෙම මුදල නිරවුල් කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. | 2001ත් 2022ත් අතර කාලයට අදාල ශේෂය රු.මිලියන 3.83ක් වේ. විවිධ ක්‍රමවේද ඔස්සේ තොරතුරු ලබා ගෙන මෙම ප්‍රතිලාභ මුදල් නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | අදාල ප්‍රතිලාභීන් හඳුනා ගැනීමට විධිමත් වැඩ පිළිවෙලක් සකස් කර මුදල් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට හිමිකම් නොපාන ලද මරණ ප්‍රතිලාභ ලෙස ප්‍රතිලාභීන් 1,253 කට අදාලව රු.මිලියන 23.37 ක මුදලක් ගෙවිය යුතුව පැවති අතර 2024 මාර්තු 31 දිනට ප්‍රතිලාභීන් 1,240 කට අදාලව එම ශේෂය රු.මිලියන 23.043 කි. මෙම ශේෂය තුල වසර 07 ත් 28 ත් අතර කාල පරාසයට අයත් ප්‍රතිලාභීන් 826 කට ගෙවිය යුතු මරණ ප්‍රතිලාභ මුදල රු.මිලියන 9.9 කි. දිගින් දිගටම පවතින මෙම ශේෂය නිරවුල් කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. | මියගිය සාමාජිකයන්ට හිමි සාමාජික ප්‍රතිලාභ නාමිකයන්ට හා ඔවුන්ගේ නීත්‍යානුකූල හිමිකරුවන්ට ගෙවීම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන හිමිකරුවන්ට ඔවුන්ට අයත් කොටස ගෙවනු ලබයි. සියලුම නාමිකයන් හා උරුමකරුවන් හඳුනාගැනීමෙන් අනතුරුව ප්‍රතිලාභ ගෙවීමට කටයුතු කළහොත් ගෙවීම් ප්‍රමාද කිරීමට හා ගෙවනු ලබන ප්‍රමාණය අඩු වීමක්ද සිදුවේ. | හිමිකම් නොපාන ලද මරණ ප්‍රතිලාභීන් හඳුනා ගෙන එම මුදල් නිදහස් කිරීමට ක්‍රමවේදයක් දියත් කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට ශිෂ්‍යත්වය සමත් සිසුන් 9,276 කට ගෙවීම සඳහා රු.මිලියන 139.14 ක ප්‍රතිපාදනයක් වෙන්කර තිබූ අතර මේ තුල 2021, 2022 හා 2023 වර්ෂවලට අදාලව පිළිවෙලින් සිසුන් 16 ක් 260 ක් හා 9,000 කට නොගෙවූ මුදල් පැවතුණි. | අයදුම්පත් ප්‍රතිලාභ පිරිනැමීමේ නිර්ණායකවලට අනුකූල නොවීම මත හා සාමාජිකයින් විසින් ඉදිරිපත් කරනු ලබන අසම්පූර්ණ අයදුම්පත්‍ර සඳහා නැවත තොරතුරු ගෙන්වා ගෙන ඒ සඳහා ගෙවීම් කිරීමට කටයුතු කරනු ලැබේ. | අසම්පූර්ණ තොරතුරු කඩිනමින් ගෙන්වා ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් සකස් කර ආධාර මුදල් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි 11 ඡේදය | 2022 වර්ෂයට අදාලව භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ ඌනතා හා අතිරික්තතා සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීම 2023 වර්ෂයේ අප්‍රේල් 30 දිනට පෙර සිදුකල යුතු වුවද | 2022 වර්ෂයට අදාලව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ ඌණතා හා අතිරික්තතා සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන කොට්ඨාශයේ නිරීක්ෂණද | චක්‍රලේඛ නියමයන් ප්‍රකාරව අදාළ ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | |
|---|---|
| 2022 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ ඇතුලත් ඌනතා ඒකක 100ක් සහ අතිරික්තතා ඒකක 60ක් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සමග විගණන කමිටුවේ සාකච්ඡාවට භාජනය වූ අතර 2023 වර්ෂය වෙනුවෙන් පවත්වන ලද වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේ හෙළිදරව් වන කරුණුද සැලකිල්ලට ගෙන මෙ පිළිබඳව ඉදිරියේදී කටයුතු කරන බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ සමූහයේ මූල්‍ය ප්‍රතිඵලය රු.මිලියන 57,133 ක් හා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.මිලියන 55,942 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ සමූහයේ හා මණ්ඩලයේ ලාභ පිළිවෙලින් රු.මිලියන 37,680 ක් හා රු.මිලියන 36,978 ක් විය. ඒ අනුව සමූහයේ හා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය පිළිවෙලින් රු.මිලියන 19,453 කින් හා රු.මිලියන 18,964 කින් වර්ධනය වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයේ පොලී ආදායම් රු.මිලියන 18,064 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵල වල වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කුලියට ලබාගත් ගොඩනැගිලි 05 ක පමණ මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාමෙන් මණ්ඩලයේ සේවාව ලබාගැනීමට පැමිණෙන සේවා සේවක දෙපාර්ශවයටම අපහසුතා පැන නගින බැවින් සේවක අර්ථසාධක අරමුදල සමග එකම ස්ථානයක සේවා සැපයීමේ පහසුව සලකා 2020 සැප්තැම්බර් මස සිට මෙහෙවර පියස ගොඩනැගිල්ලේ මහල් 5 ක මණ්ඩලයේ කාර්යාලයන් ස්ථාපනය කර ඒ සඳහා මසකට කුලී මුදල් ලෙස රු.මිලියන 10.3 ක් ගෙවනු ලැබේ. උක්ත අරමුණින් විශාල වැය බරක් දරමින් එකම ස්ථානයක ස්ථාපිත කල ද මණ්ඩලයෙහි කටුබැද්ද හා මහරගම ප්‍රාදේශීය කාර්යාල 2021 දෙසැම්බර් සිට 2023 නොවැම්බර් දක්වා වර්ෂ 3 ක කාලයකට නැවත කටුබැද්ද හා මහරගම ප්‍රදේශවල කුලී ගොඩනැගිලිවල ස්ථාපනය කර මසකට පිළිවෙලින් රු. 120,000 ක හා රු. 100,000 ක බැගින් කුලී ගෙවමින් පවත්වාගෙන යාමට කළමනාකරණය කටයුතු කර තිබුණි. නමුත්, කටුබැද්ද | 2020 වර්ෂයේ ආරම්භ වූ කොරෝනා වසංගතයේ දෙවන අධියර 2021 වර්ෂයේ නැවත හිස එසවීමත් සමග විශාල පිරිසක් ප්‍රධාන කාර්යාලය වෙත පැමිණීම නුසුදුසු වූ බැවින් ඊට විකල්පයක් ලෙස කටුබැද්ද ප්‍රදේශයෙන් හා මහරගම ප්‍රදේශයෙන් ගොඩනැගිලි 2021 දෙසැම්බර් 01 දින සිට කුලී පදනම මත ලබාගන්නා ලදි. අවධානම් තත්ත්වය පහව යාමත් සමග එම මහජන සේවාවන් ප්‍රධාන කාර්යාලයේ පවත්වාගෙන යාමට ලද අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ප්‍රකාරව කුලී පදනමින් ලබාගත් ගොඩනැගිලි දෙකෙහි ගෙවීම් කටයුතු නිරවුල් කර හිමිකරුවන් වෙත නැවත භාරදෙන ලදි. | මණ්ඩලයට මූල්‍යමය පාඩුවක් නොවන ආකාරයට කටයුතු සම්පාදනය කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කාර්යාලය 2023 ඔක්තෝබර් 30 දින හා මහරගම කාර්යාලය 2023 අප්‍රේල් මස සිට එම කුලී ගොඩනැගිලිවලින් ඉවත්කර නැවත මෙහෙවර පියස ගොඩනැගිල්ලෙහි ස්ථාපිත කර තිබීමෙන් කටුබැද්ද කාර්යාලයට රු.මිලියන 2.04 ක් හා මහරගම කාර්යාලයට රු.මිලියන 1.7 ක්ද මණ්ඩලය අතිරේක ලෙස ගෙවා තිබුණි. | | |
| (ආ) | ප්‍රාදේශීය කාර්යාල පවත්වාගෙන යාම සඳහා බදු පදනමින් ලබාගත් ගොඩනැගිලි 04ක ගිවිසුම කාල සීමාව දීර්ඝ කර ඇති නමුත් අවශ්‍යතා ප්‍රකාරව ගිවිසුම ලියාපදිංචි කිරීම 2024 මාර්තු මස වනවිටත් සිදුකර නොතිබීමෙන් ගිවිසුම් රහිතව පවත්වාගෙන යන කාලය වෙනුවෙන් ගෙවූ කුලී මුදල රු.මිලියන 5.26ක් විය .නාරාහේන්පිට විශේෂ ආර්ථික මධ්‍යස්ථානයේ කුලී පදනමින් පවත්වාගෙන යනු ලබන මණ්ඩලයේ ලේඛනාගාරය සඳහා 2022 අප්‍රේල් සිට 2023 දෙසැම්බර් දක්වා විධිමත් කුලී ගිවිසුමකට එළඹීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණු අතරම ,එම කාලයට අදාලව ගෙවිය යුතු හිඟ කුලී මුදල රු.මිලියන 4.06ක් විය . | ප්‍රාදේශීය කාර්යාලයන් පවත්වාගෙන යාම සඳහා බදු පදනමින් ලබාන්නා ලද, ගාල්ල ප්‍රාදේශීය කාර්යාලයේ බදු ගිවිසුම 2024 මැයි 21 වන දින අත්සන් තබා ලියාපදිංචි කර තිබෙන අතර අනෙකුත් කාර්යාල තුනෙහි බදු ගිවිසුම් ලියාපදිංචිය සඳහා මේ වන විට යොමු කර පවතී. නාරාහේන්පිට විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ භාරය 2022 අප්‍රේල් මස සිට නාගරික සංවර්ධන අධිකාරිය යටතට පවරා ගන්නා ලද අතර බදු ගිවිසුම් සකස් කිරීමද එම අධිකාරිය විසින් සිදුකරනු ලබයි. අප විසින් 2023 අප්‍රේල් 10 දින, 2024 ජනවාරි 02, 2024 පෙබරවාරි 12 දින වලදී මේ පිළිබඳ විමසීම් ලිපි යොමු කරමින් අදාල බදු ගිවිසුම් සකස් කර එවන ලෙස දැනුම් දී ඇත. | නියමිත කාලය තුල ගිවිසුම් වලට එළඹීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | මණ්ඩලයේ කාර්ය මණ්ඩලය සඳහා වන වෛද්‍ය සහනාධාර ක්‍රමය යටතේ බිල්පත් ප්‍රතිපූර්ණයේ දී එක් සාමාජිකයෙකුගෙන් මෙම යෝජනා ක්‍රමය සඳහා අයකරන මුදල රු. 30 සිට රු. 150 දක්වා වැඩිකර තිබූ නමුත් 2022 වර්ෂයේ හා 2023 වර්ෂවලදී වෛද්‍ය ප්‍රතිපූර්ණ මුදලින් සියයට 97 ක හා 95 ක දායකත්වයක් මණ්ඩලය විසින් දරා තිබුණි. 2023 වර්ෂයේ දි මණ්ඩලයේ දායකත්වය රු.මිලියන 128.55 ක් වූ අතර, සාමාජික දායකත්වය රු.මිලියන 6.77 ක් විය. 2023 අගෝස්තු 15 දින නිකුත් කරන ලද පරිපාලන හා මානව සම්පත් කොට්ඨාශ චක්‍රලේඛ ලිපි අංක 2013/14 මගින් සාමාන්‍ය වියදම් ප්‍රතිපූර්ණය කිරීමේ ක්‍රමවේදය යටතේ පැවති විශේෂ උපකරණ හා නිවැරදි කිරීමේ උපකරණ වියදම් රෝහල්ගත වියදම් යටතේ ප්‍රතිපූර්ණය කිරීමට | වෛද්‍ය ගාස්තු, ඖෂධ හා උපකරණ වියදම් අසාමාන්‍ය පරිදි වැඩිවීම මත උපරිමය රු.60,000/-ක් වූ සාමාන්‍ය වෛද්‍ය වියදම් යටතේ ප්‍රතිපූර්ණය කිරීමට ප්‍රමාණවත් නොවීම මත, විශේෂ උපකරණ හා නිවැරදි කිරීම් උපකරණ වියදම්, රෝහල්ගත වියදම් යටතේ ප්‍රතිපූර්ණය කිරීමට අනුමැතිය ලබාදෙන ලදි.<br><br>සියලුම වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම පූර්ව විගණනයට ලක් කිරීම ද රු.20,000/- ඉක්මවූ බිල්පත් පූර්ව විගණනයෙන් අනතුරුව වෛද්‍ය කමිටුවේ අනුමැතියට ද යොමු කරනු ලැබේ.<br><br>ඇස්කණ්ණාඩි සඳහා රු.50,000/-ක උපරිමයකට යටත්ව එක් අයකුට වසර දෙකකට වරක් පමණක් වියදම් ප්‍රතිපූර්ණය කළහැකි අතර, රු.50,000/- ඉක්ම වූ දන්ත වෛද්‍ය ප්‍රතිකාර සඳහා වියදම් දැරීමට පෙර | තීරණ ගැනීමේදී මනා අධ්‍යයනයකින් හා සැලකිල්ලකින් යුතුව ක්‍රියාකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අනුමැතිය ලබාදීමේ දී උපරිමයක් නියම කිරිමට කටයුතු නොකිරිම තුලින් 2023 සැප්තැම්බර් සිට එම උපකරණ සඳහා ඉහළ වටිනාකමක් සහිත බිල්පත් ප්‍රතිපූර්ණය කිරීමේ අවස්ථාව ලබාදිමට සිදුවී තිබුණි. | වෛද්‍ය කමිටුවේ පූර්ව අනුමැතිය ලබාගත යුතුවේ.<br><br>ඉහළ වටිනාකමක් සහිතව සාවද්‍ය වෛද්‍ය බිල්පත් ඉදිරිපත් කරන ලද පාර්ශවයන්ට විරුද්ධව විනය පියවර ගෙන තිබේ. | |
| (ඇ) | සංස්ථාපිත පනත අනුව මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරියා මණ්ඩලයේ සභාපතිවරයා වන නමුත්, මූල්‍ය කටයුතු සම්බන්ධ ආයතනයක් ලෙස මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරියා එහි සභාපතිවරයා විය යුතු බවට වන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල පනතේ 5 (2) වගන්තිය සංශෝධනය කල යුතු බවට 2016 අගෝස්තු 26 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේ දී නිර්දේශ කර තිබුණ ද 2023 වර්ෂය අවසාන වන විටත් එම කටයුතු නිමකර නොතිබුණි. | අවස්ථා ගණනාවකදී පනත සංශෝධන කටයුතු සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන ඇත. මේ වනවිට නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල පනත සංශෝධනය සඳහා කෙටුම්පත් කර ඇති මූලික කෙටුම්පතට උක්ත 5(2) වගන්තිය සඳහා යෝජිත සංශෝධනය ඇතුලත් කිරීමට ඇති හැකියාව පිළිබඳව සොයා බලන ලෙස දැනුම් දී ඇත. මේ සම්බන්ධයෙන් අදාල කටයුතු සිදුකෙරෙමින් පවතින අතර ප්‍රගතිය පිළිබඳව මණ්ඩලය විසින් අඛණ්ඩව පසුවිපරම් කරමින් පවතී. | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවෙන් ලබාදුන් නියෝග ක්‍රියාත්මක කිරීමට කළමණාකරනය කටයුතු කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට ලයිස්තුගත සමාගම් 11 ක සිදු කර තිබූ ආයෝජනයන්ගේ සාමාන්‍ය පිරිවැය රු.මිලියන 641 ක් වූ කොටස්වලට අදාලව 2023 වර්ෂයේ ලාභාංශ ආදායම් ලැබී නොතිබුණි. 2015 සහ 2019 වර්ෂවල සිට 2023 දක්වා නොකඩවා ලාභාංශ නොලැබූ සමාගම් එක බැගින්ද 2020 සහ 2021 වර්ෂවල සිට 2023 දක්වා ලාභාංශ නොලැබූ සමාගම් දෙක බැගින්ද ඒ තුළ විය. | 2015 හා 2019 වසරේ සිට ලාභාංශ ලැබී නොමැති සමාගම් දෙකම සංචාරක හෝටල් ක්ෂේත්‍රයට අයිති සමාගම් දෙකක් වන අතර 2023 වසරේ අගභාගයේ සිට නැවතත් සංචාරක ව්‍යාපාර ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනයක් පෙන්නුම් කරනු ලබන බැවින් හා වර්තමානයේ මෙම සමාගම්වල කොටස් වෙළඳපොළ මිළද ඉහළ අගයක් ගෙන ඇති බැවින්ද 2024 වසරේ මෙම සමාගම්වලින් ලාභාංශ ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.<br>මෙකී සමාගම්වල කොටස් වෙළඳපොළ මිළ තත්‍ය පිරිවැයට වඩා ඉහළ අගයක් ගන්නා විටකදී ප්‍රාග්ධන ලාභ සහිතව විකුණා ප්‍රාග්ධන ලාභ ලබාගැනීමට කටයුතු කරනු ලබන බව. | සාමාජිකයන්ට ඉහළ ප්‍රතිලාභයක් ලබාදීමට හැකි පරිදි ආයෝජන කළඹ කළමණාකරනය කළ යුතුය. |
| (ආ) | 2023 දෙසැම්බර් 31 දිනට ඒකක 4,705,833 ක පිරිවැය රු. මිලියන 142.6 ක් ඒකකභාර අරමුදලේ ආයෝජන සඳහා 2023 වර්ෂයේ ලාභාංශ ලැබී නොතිබුණි. එම ඒකකභාර අතුරින් National Equity Fund හි සිදුකළ ආයෝජන සඳහා | 2023 වර්ෂයේදී ඇති වූ වෙළඳපොළ වාසිදායක තත්වයන් යටතේ ඒකකභාර විකුණා ප්‍රාග්ධන ලාභ ලෙස රු.මිලියන 11.96ක් උපයාගෙන තිබේ. එසේම National Equity Fund ඒකකභාර වෙළඳපොළ මිළ ගණන් 2020 දෙසැම්බර් 31 සිට අඛණ්ඩව ඉහළ අගයක් පෙන්නුම් කර තිබෙන අතර | සාමාජිකයන්ට ඉහළ ප්‍රතිලාභයක් ලබාදීමට හැකි පරිදි ආයෝජන කළඹ කළමණාකරනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 2020 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වාම ලාභාංශ ලැබී නොතිබුණි. මේ නිසා එම ලාභාංශ ආදායම් සාමාජිකයා වෙත ලැබී නොතිබුණි. | ඉදිරියේදී ප්‍රාග්ධන ලාභ සහිතව විකිණීමට සහ ලාභාංශ ද ප්‍රකාශයට පත්කරනු ඇතැයි ද අපේක්ෂා කරන බව. | |
| (ඇ) | මණ්ඩලයේ ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශයේ 4 වන පරිච්ඡේදයේ සඳහන් පරිදි මණ්ඩලයේ අතිරික්ත මුදල් රජයේ සුරැකුම්පත්වල සියයට 87 ක් ආයෝජනය කල යුතු ලෙස දක්වා තිබුනද 2023 දෙසැම්බර් 31 දිනට ආයෝජන සංයුතිය පරීක්ෂාවේදී එම ආයෝජනය සියයට 92 ක් වී තිබුණි. | ජාතික සංවර්ධනය සඳහා යොදා ගනු ලබන වඩාත් සුරක්ෂිත, ස්ථිර, පොලී ආදායමක් සහිත භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජන මත මෙකී ප්‍රතිශතය වෙනස් වී තිබේ. මෙමගින් සාමාජික අරමුදල වඩාත් සුරක්ෂිත වී තිබෙන අතර අලාභයක් සිදු වී නොමැත. | ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් පරිදි ආයෝජන කළඹ හැසිරවීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2022 වර්ෂය අවසානය වනවිට ලියාපදිංචි සේවායෝජක සංඛ්‍යාව වූ 189,850 න් සියයට 66 ක් හෙවත් 125,850 ක් අක්‍රිය සේවායෝජකයින් විය. මණ්ඩලය විසින් ලියාපදිංචි සේවා යෝජක ආයතන යාවත්කාලීන කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය. | 2019 සිට 2022 වර්ෂය දක්වා පැවැති Covid වසංගත තත්ත්වය, ආර්ථික අර්බුදය හේතු කොටගෙන එම වකවානුවේදී ඇතැම් සේවායෝජක ආයතන වසා දමා තිබූ අතරම, ක්ෂේත්‍ර පරීක්ෂණ මගින් සේවායෝජක ආයතන පරීක්ෂාවද සිදුකළ නොහැකි වී තිබුණි. 2022 ජූලි මාසයේ සිට කේෂේත්‍ර පරීක්ෂණ කටයුතු නැවත ආරම්භ කර අක්‍රිය සේවායෝජක ආයතන සක්‍රිය කර ගනිමින් පවති. | අක්‍රිය සේවායෝජකයින් හඳුනාගෙන සක්‍රිය කර ගැනීමේ ක්‍රියාත්මක ක්‍රමවේදය වැඩි දියුණු කළ යුතුය. |
| (ඉ) | ස්වයංරැකියාලාභීන් හා සංක්‍රමණික සේවකයන් මණ්ඩලයේ ලියාපදිංචි කර ගැනීම වර්ධනය කර ගැනීම සඳහා වෙනම අංශයක් මණ්ඩලය යටතේ පිහිටුවා තිබුනද, 2023 වර්ෂයේ ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාල 13 ක් විසින් බඳවාගෙන තිබූ සාමාජික සංඛ්‍යාව 456 ක් පමණක් විය. එමෙන්ම Labour Force Survey – Annual Report – 2019 අනුව ශ්‍රී ලංකාවේ වාර්ථාගත වී ඇති මුළු ස්වයංරැකියාලාභීන් සංඛ්‍යාව 3,233,290 ක් වුවත් අරමුදලේ ලියාපදිංචි ස්වයංරැකියාලාභීන් සංඛ්‍යාව 42,753 ක් වීමෙන් මණ්ඩලයේ අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි. | පසුගිය වකවානුවේදී පැවැති අයහපත් ආර්ථික තත්ත්වය මත ස්වයංරැකියා ප්‍රවර්ධන කටයුතු සිදුකළ නොහැකි වූ අතර, මේ වනවිට ප්‍රවර්ධන කටයුතු නැවත සැලසුම් කරමින් පවති. | ස්වයං රැකියාලාභීන් ලියාපදිංචි කිරීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඊ) | 2023 වර්ෂයේ දී සංක්‍රමණික සේවකයන් ලෙස බඳවාගත් ප්‍රමාණය 14 ක් වූ අතර 2020, 2021 සහ 2022 වර්ෂවලදී එය පිළිවෙලින් 04,19 ක් හා 16 ක් විය. එමෙන්ම 2024 මාර්තු 02 දින වන විටත් 2006 වර්ෂයට පෙර | සංක්‍රමණික සේවකයන් බඳවා ගැනීමට හා ප්‍රවර්ධනයට අදාල ව්‍යාපෘති වාර්තාවක් කෙටුම්පත් කරමින් පවතින අතර එය අනුමත වූ වහාම ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ. මේ වනවිට දත්ත පරිගණක ගත කිරීමේ කටයුතු සිදුකරමින් පවතී. | බඳවා ගැනීම ප්‍රවර්ධනය සඳහා සැලසුම් ගත කාර්යයන් කඩිනමින් ක්‍රියාත්මක කළ යුතු අතරම දත්ත |

| | | | |
|---|---|---|---|
| | මණ්ඩලයේ ලියාපදිංචි වූ සංක්‍රමණික සාමාජිකයන්ට අදාල දත්ත පරිගණකගත කර නොතිබුණි. | | පරිගණක ගත කිරීම් කටයුතු කඩිනම් කර යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | මණ්ඩලය විසින් සක්‍රීය සේවාදායකයින් වෙත 2015 වර්ෂයත් 2022 වර්ෂයත් අතර කාලපරිච්ඡේදය තුලදී ලබාදුන් සුභසාධන ප්‍රතිලාභ පිළිබඳ සංඛ්‍යාමය දත්ත අනුව සමස්ථ සක්‍රිය සාමාජිකත්වයෙන් සියයට 0.41 ත් සියයට 0.68 ත් අතර ප්‍රමාණයක් පමණක් මෙම ප්‍රතිලාභ ලබාගෙන තිබුණු බව නිරීක්ෂණය විය. මෙම ප්‍රතිලාභ සම්බන්ධයෙන් මණ්ඩලය සාමාජිකයින් දැනුවත් කිරීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගෙන තිබුණ ද ප්‍රතිලාභ ලැබූ සාමාජික සංඛ්‍යාවේ සැලකිය යුතු වර්ධනයක් සිදුවී නොමැති අතරම, සාමාජික දැනුවත් වීම තවදුරටත් වර්ධනය කලයුතු බව විගණනයේ දී නිරීක්ෂණය විය. | මණ්ඩලය මේ සම්බන්ධයෙන් පහත ක්‍රියාමාර්ග ගෙන ඇත.<br>• සේවා ප්‍රදේශ ආවරණ වන පරිදි ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් දැනුවත් කිරීම් වැඩසටහන් 2023 හා 2024 වර්ෂවලදී පැවැත්වීම.<br>• වාර්ෂික ගිණුම් ප්‍රකාශ/අත්පොත මගින් දැනුවත් කිරීම.<br>• නිලධාරී පුහුණුව " ජයගමු ශ්‍රී ලංකා" වැඩසටහන මගින් දැනුවත් කිරීම. | ප්‍රතිලාභ ගෙවීම් පිළිබඳව සාමාජිකයින් දැනුවත් කිරිම සඳහා ගනු ලබන ක්‍රියා පිළිවෙත් තවදුරටත් වර්ධනය කළ යුතුය |
| (ඈ) | සේවායෝජක හා සාමාජික ගිණුම් , සාමාජික අරමුදල වඩාත් නිවැරදිව හා විශ්වාසනීයව පවත්වාගෙන යාම , සාමාජිකයින් හා සේවායෝජකයින් සඳහා මාර්ගගත සන්නිවේදන ක්‍රම මගින් පද්ධතිය හා සම්බන්ධ වීමට සැලැස්වීමේ අරමුණින් මුදල් අමාත්‍යාංශ මූල්‍ය ප්‍රතිපාදන යටතේ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය හා මණ්ඩලය අතර 2016 වර්ෂයේ දී අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි . ව්‍යාපෘති කටයුතු ආරම්භයේ සිට මේ දක්වා මණ්ඩලය විසින් දෘඩාංග මිලදී ගැනීම හා පුහුණු කටයුතු වෙනුවෙන් රු.මිලියන 183.28ක් වැයකර තිබුණද වර්තමානය වනවිටත් පද්ධතිය සජීවි මෙහෙයුම් ක්‍රියාවලියක් බවට පත්කර ගැනීමට නොහැකි වී තිබුණි . | 2023 වර්ෂයේ දෙවන භාගය තුල මෙහෙයුම් පිළිගැනීමේ සැසි ආරම්භ කිරීමට සැලසුම් කල නමුත්, විවිධ අඩුපාඩු මත නියමිත දිනට ආරම්භ කල නොහැකි විය.<br><br>ඉදිරියේදී පද්ධතියේ මෙහෙයුම් පිළිගැනීමේ පරීක්ෂණය හා අනෙකුත් ක්‍රියාවලින් අවසන් කිරිමෙන් පසුව පද්ධතිය සජීවී මෙහෙයුම් ක්‍රියාවලියක් බවට පත්වූ විට මෙම පද්ධතියෙන් අපේක්ෂා කළ සියලු අරමුණු සාර්ථක ලෙස නිමකර සමස්ථ සාමාජිකයන්ට එහි ප්‍රතිලාභ උදාකර ගත හැකිවේ. | පද්ධතිය සජීවි මෙහෙයුම් ක්‍රියාවලියක් බවට පත්කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |
| (එ) | සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය ලබානොගෙන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ පමණක් ලියාපදිංචි වන සේවායෝජකයින් වෙනුවෙන් | සේවක අර්ථසාධක අරමුදලෙහි ලියාපදිංචි කර නොමැති ආයතන පරීක්ෂා කිරීමෙන් පසුව එම ආයතනවල හිග මුදල් අයකර ගැනීම සඳහා 2015ට පෙර XX හා ZZ නිකුත් කරනු ලැබූ අතර 2015න් පසු AX – | තොරතුරු ලබාගෙන නිවැරදි සේවායෝජක ගිණුම්වලට බැරකිරීමට කටයුතු |

| | | | |
|---|---|---|---|
| | මණ්ඩලය විසින් AX සිට XX දක්වා තාවකාලික ගිණුම් (Dummy Accounts) පවත්වාගෙන යන අතර, 2023 දෙසැම්බර් 31 දිනට එවැනි සේවායෝජකයින් 28,994 ක් විසින් එවන ලද දායක මුදල් එකතුව රු.මිලියන 309.97 ක් විය. මේ තුල වසර 8 ත් වසර 41 ත් අතර කාලයට අදාල ශේෂ එකතුව රු.මිලියන 209.95 ක් විය. මෙම තාවකාලික ගිණුම්වල (Dummy Accounts) පවතින දායක මුදල් නිවැරදි සේවායෝජක ගිණුම්වලට බැරකිරීම සඳහා සුදුසු ක්‍රමවේදයක් මෙතෙක් හඳුන්වා දී නොතිබුණි. | WX අංක නිකුත් කිරීම සිදුකරනු ලබයි. එම ආයතන සේ.අ.අ. යටතේ ලියාපදිංචිය සිදුකරන තෙක් අයකරගත් මුදල් හා සාමාජික ප්‍රතිලාභ ගෙවීම් සිදු කිරීමද එම අංක යටතේම සිදුකරයි.<br><br>එම මුදල්වලට අදාල සේ.අ.අ. අංක හඳුනාගැනීම නිරන්තරයෙන් සිදුවන අතර ඒ සඳහා ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් හා අදාල කම්කරු කාර්යාල මගින් තොරතුරු ලබාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබයි. | කළ යුතුය. |
| (ඒ) | සාමාජික නම හා වලංගු හැඳුනුම්පත් අංකය රහිතව පවත්වාගෙන යන ගිණුම් 7,566 කට අදාලව රු.මිලියන 41.22 ක මුදලක් 2023 දෙසැම්බර් 31 දිනට පවතින අතර, 2015 වර්ෂය දක්වා හඳුනාගත නොහැකි එම සාමාජික ගිණුම් පරිගණක පද්ධතියේ අගුළු දැමීමට ක්‍රියාකර ඇති බව 2024 අප්‍රේල් 29 දිනැතිව විගණනය වෙත ලබාදුන් තොරතුරු අනුව අනාවරණය විය. 2024 මැයි 04 දින වනවිටත් මෙම මුදල් හඳුනාගෙන සාමාජිකයින්ට බැර කර නොතිබුණි. | සාමාජිකයන්ගේ නම සහ වලංගු හැඳුනුම්පත් අංකය නොමැතිව ඇති සාමාජික ගිණුම් දැනට පරිගණක පද්ධතියේ අගුලු දමා තිබෙන අතර යම් අවස්ථාවක සේවායෝජක විසින් සාමාජිකයන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන අවස්ථාවක හෝ අනන්‍යතාවය තහවුරු කරන අවස්ථාවකදී එසේ අගුලු දමා තිබෙන සාමාජික ගිණුම් තොරතුරු ලබාදෙන සාමාජිකයාගේ අගුලු ඉවත් කර නිවැරදි සාමාජිකයාගේ නම, හැඳුනුම්පත් අංකය ඇතුලත් කර ගිණුම් යාවත්කාලීන කිරීමට පියවර ගනු ලැබේ. | අගුළු දමා තිබෙන ගිණුම් පිළිබඳ කටයුතු කිරීමට ක්‍රමවේදයක් දියත් කළ යුතුය. |